# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,487 - 2026 අප්‍රේල් මස 30 බ්‍රහස්පතින්දා - 2026.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 1776 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 1803 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මැයි මස 22 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 08 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා පොලීසිය**
**ආධුනික උප පොලිස් පරීක්‍ෂක තනතුර (සාමාන්‍ය පොලිස් සේවය /විශේෂ කාර්ය බලකාය)**

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික උප පොලිස් පරීක්‍ෂක තනතුර (සාමාන්‍ය ) උප පොලිස් පරීක්‍ෂක තනතුර (විශේෂ කාර්ය බලකාය ) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර **2026.06.05** දිනට පෙර යොමුකල යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේදී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කරු විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

**(අ)** **මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.**

**(ආ)** **සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.**

**(ඇ)** **මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණයකරනු ඇත.**

**(ඈ)** **තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම ගැසට් නිවේදනය අවලංගු වේ.**

**(ඉ)** **අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්‍ෂණ පවත්වනු ලැබේ.**

**03.** **වැටුප් ක්‍රමය - (මාසිකව)** **<u>උප පොලිස් පරීක්‍ෂක තනතුර (සාමාන්‍ය )</u>**

රු. 55410-7x 670-2x890-25x1,190- රු. 91630 (RS 03-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණය සමග මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | *රු. ශත* |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | 17800.00 |
| (*ආ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (*ඇ*) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 13440.20 |
| (*ඈ*) | ආහාර හා නවාතැන් දීමනාව | 31800.00 |
| (*ඉ*) | දුෂ්කර දීමනාව | 2000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා :

| | | |
|---|---|---|
| (*ඊ*) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 3000.00 |
| (*උ*) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |

**වැටුප් ක්‍රමය - <u>(මාසිකව)</u>** <u>*උප පොලිස් පරීක්‍ෂක තනතුර (විශේෂ කාර්ය බලකාය )*</u>

රු. 55410-7x 670-2x890-25x1,190- රු. 91630 (RS 03-2025)

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/ 2025 අනුව සිදු කර ඇත.

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | රු. ශත |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | 17800.00 |
| (ආ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | 250.00 |
| (ඇ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | 13440.20 |
| (ඈ) | ආහාර හා නවාතැන් දීමනාව | 31800.00 |
| (ඉ) | දුෂ්කර දීමනාව | 2000.00 |
| (ඊ) | දිරි දීමනාව( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 1500.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (උ) | මූලික වැටුපෙන් 25% ( රාජකාරියේ යෙදවීමෙන් පසු ) | 13852.50 |
| (ඌ) | ප්‍රභූ ආරක්ෂක (ප්‍රභූ ආරක්ෂක පාඨමාලාව හැදෑරීමෙන් පසු ) | 800.00 |
| (එ) | සීතල දීමනාව 8% ( හිමිකම ඇති කඳවුරුවලට පමණි) | 4432.80 |
| (ඒ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | 3000.00 |
| (ඔ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | 500.00 |
| (ඕ) | විවාහක දීමනාව( විවාහක නිළධාරීන් සඳහා) | 300.00 |

**මෙම දීමනාවලට අමතරව (සාමාන්‍ය පොලිසිය හා විශේෂ කාර්ය බලකාය සඳහා)**

(අ) ප්‍රවාහන පහසුකම්

(ආ) නිලධාරින්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) නිල ඇඳුම්

(ඈ) සුදුසුකම් සපුරන නිලධාරින්ට රාජ්‍ය විශ්ව විද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.

(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණුකර ගැනීමේ පහසුකම්

(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

තවද, මෙම නිලධාරින් 2022.12.15 වැනි දිනැති ශ්‍රී ලංකා පොලිසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි.

**04. මූලික සුදුසුකම් :**

**4.1 අධ්‍යාපන සුදුසුකම් ;**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් එකවර සමත්වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් 03 කින් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර)

*සටහන 01* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් ලෙසද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්‍ෂණ විෂයය ලිඛිත පරීක්‍ෂණයෙන් අසමත්වීම එම විෂයේ ප්‍රායෝගික පරීක්‍ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා/පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

**4:2** **කායික සුදුසුකම් ;**

**සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.**

**4:3** වෙනත් **;**

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවීම.

4:3:3 අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන් සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 06 හෝ ඊට වැඩි විය යුතුයි. (සෙන්ටිමීටර් 167.64)

4.3.6 පපුව අවම වශයෙන් හුස්ම නාල්ලා අඟල් 32 ක් විය යුතු ය. (සෙන්ටිමීටර් 81.28)

4:3:7 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතුය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:8 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:9 අයදුම්කරුගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයන්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

*සටහන 01* **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1 සහ 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනටද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

*සටහන 02* **ඉහත පටිපාටීන්ට පරිබාහිරව පොලිස් රාජකාරි හෝ ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්‍ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම්කර ඇති** අයදුම්කරුවකුගේ උස සහ පපුව පිළිබඳ **සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4** වයස **:**

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

***සටහන* -** පොලිස් සේවයේ නියුතු නිලධාරියකු අයදුම්කරන්නේ නම් උපරිම වයස් සීමාව 28කි.

**05.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

**i.** **මූලික පරීක්‍ෂණය:**

අයදුම්පත් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්‍ෂණයේදී ඉහත ඡේද 4:1, 4:2 හා 4:4 (4:3:1, 4:3:2,4.3.4 ,4.3.7, 4.3.9 හැර) සුදුසුකම් පරීක්‍ෂා කරනු ලැබේ.

**ii.** **ඔරොත්තු දීමේ පරීක්‍ෂණය:**

මූලික පරීක්‍ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක්

මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කරුවන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| ක්‍රියාකාරකම | කාලය | ලකුණු |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chin up (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Sit up (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්‍ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

*සටහන :* **1.** මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

**2.** සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාසවලින් මුලු ලකුණු 50%ක්ද පොලිස් විශේෂ කාර්ය බලකාය සඳහා බඳවාගැනීමේදී ඉහත අභ්‍යාස වලින් මුලු ලකුණු 60%ක්ද යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකනු ලැබේ.

**06. ලිඛිත විභාගය :**

ඔරොත්තුදීමේ පරීක්ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

**07. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛනය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් (1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| **එකතුව** | 100 | |

08. **පසුබිම් පරීක්ෂණය :**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතුකොට අයදුම්කරුවන් ලබාගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස්කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කරුවන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහිදී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09. වෛද්‍ය පරීක්ෂණය :**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන් සෞඛ්‍ය 169 පෝරමය සම්පූර්ණකර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ. අයදුම්කරුවන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන අදාළ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම යන වාර්තා 02 මගින්ම යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව :**

10:1 බඳවාගනු ලබන නිලධරයන් පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ දී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළ හොත් එම කාලයට සමාන කාලසීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි :**

11:1 තෝරා ගනු ලබන අයදුම්කරුවන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු පරිවාස කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

11:4 තුන් (03) අවුරුදු පරිවාස කාලය තුළ, සිටින නිලධාරියෙකු සම්බන්ධයෙන් වන සුවිශේෂී කරුණු පිළිබඳව සලකා බලා පොලිස්පති හෝ පොලිස්පති විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස ඒම කාලය තුළදී විවාහ විය නොහැක. මෙම රෙගුලාසි උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

11:5 බඳවා ගන්නා අයදුම්කරුවන් බඳවා ගන්නා අවස්ථාවේ දී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හි දී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වාගෙන යා යුතු ය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධාරින්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

13:2 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරියෙකුගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14. කාර්යක්ෂමතා කඩඉම :**

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් උප පොලිස් පරීක්ෂක මුල් පත්වීම් දිනයේ සිට වසර තුනක්(03) ඇතුළත | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | පොලිස් පරීක්ෂක තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

**15.** **භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

16. මෙම *ගැසට් පත්‍රයේ* 1 කොටස (11 අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්කරුවන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී උඩුගත කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) ජාතික හැඳුනුම්පත
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කරු තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතුය)
(*ඊ*) උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා අයදුම්කරන, දැනට පොලිස් සේවයේ නියුතු අයදුම්කරුවකු නම් කොට්ඨාසභාර නිලධාරී/අධ්‍යක්ෂ මගින් ලබාගන්නා ලද ලිපිය (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය.)
(*උ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේ දී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................................................................ මහතා ................................ ........................................................... දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

.........................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන
නම.................................
දිනය ................................. නිල මුද්‍රාව

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.**

ප්‍රියන්ත වීරසූරිය,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

04 - 353/1

**ශ්‍රී ලංකා පොලීසිය**

ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය පොලිස් සේවය)

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර (සාමාන්‍ය ) සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** www.police.lk වෙබ් අඩවියට පිවිස " join us" විකල්පය තෝරා ගැනීමෙන් (Click කිරීමෙන්) හෝ පහත සඳහන් QR කේතය ස්කෑන් (Scan) කිරීමෙන් අයදුම්පත වෙත ඇතුළත් වී මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණක් අයදුම්පත් සම්පූර්ණ කර 2026.06.05 දිනට පෙර යොමුකළ යුතු අතර, කිසිදු අයදුම්පතක් තැපැල් මගින් යොමු නොකළ යුතු ය. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමුකල අයදුම්පතේ පිටපතක් මූලික පරීක්ෂණය සඳහා පැමිණීමේ දී අයදුම්කරු විසින් රැගෙන පැමිණිය යුතු ය. (පිටපතේ අයදුම්කාරිය විසින් තම අත්සන යොදා තිබිය යුතු ය.)

**(අ) මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතීනම් සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.**

**(ආ) සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලබයි.**

**(ඇ) මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මා විසින් තීරණය කරනු ඇත.**

**(ඈ) තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම *ගැසට්* නිවේදනය අවලංගු වේ.**

**(ඉ) අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.**

**03.** වැටුප් ක්‍රමය - **(මාසිකව)** කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර **(සාමාන්‍ය )**

රු. 55410-7x 670-2x890-25x1,190-රු. 91,630 (RS 03-2025)
මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 10/ 2025 අනුව සිදු කර ඇත.
ඉහත සඳහන් වැටුප් පරිමාණය සමග මෙහි පහත සඳහන් දීමනා මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 17800.00 |
| (ආ) | නිල ඇඳුම් පිරිසිදු කිරීම් දීමනාව | රු. 250.00 |
| (ඇ) | මූලික වැටුපෙන් 22% +රු.1250.00 | රු. 13440.20 |
| (ඈ) | ආහාර හා නවාතැන් දීමනාව | රු. 31800.00 |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2000.00 |

පුහුණුවෙන් පසු ගෙවීම් කරනු ලබන දීමනා

| | | |
|---|---|---|
| (ඊ) | අර්ධද්වීප දීමනාව(යාපනය අර්ධද්වීපයට පමණි) | රු. 3000.00 |
| (උ) | සිගරට් දීමනාව (මෙහෙයුම් කලාප සඳහා) | රු. 500.00 |

**මෙම දීමනාවලට අමතරව**

(අ) ප්‍රවාහන පහසුකම්
(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) නිල ඇඳුම්
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්වවිද්‍යාල, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් දීමනා, දුෂ්කර දීමනා හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

තව ද, මෙම නිලධාරිණියන් 2022.12.15 දිනැති ශ්‍රී ලංකා පොලීසියේ නිවේදන CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි.

**04. මූලික සුදුසුකම්**

**4.1 අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව,සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් පහක් (05) සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් එකවර සමත්වීම;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරක දී විෂයයන් 03 කින් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

***සටහන 01*** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන 02*** අ.පො.ස. (සා/පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන 03*** වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා/පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

**4:2 කායික සුදුසුකම්**

**සෑම අපේක්ෂිකාවක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.**

**4:3 වෙනත්**

4:3:1 ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

4:3:2 අයදුම්කාරිය අයහපත් චරිතයකින් යුක්ත නොවීම.

4:3:3 අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, ගර්භණීව සිටීම සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි)

4:3:4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.3.5 උස අඩි 05 අඟල් 04 හෝ ඊට වැඩි විය යුතු යි. (සෙන්ටිමීටර් 162.56)

4:3:6 උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතු ය, එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතු ය.

4:3:7 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතු ය.

4:3:8 අයදුම්කාරියගේ සමීප ඥාතීන් (මව, පියා, භාරකරු, සමීපව සම්බන්ධතා පවත්වන අවිවාහක හෝ විවාහක සහෝදරයන්/ සහෝදරියන් සහ ඔවුන්ගේ කලත්‍රයින්) අපරාධ වරදකට වරදකරු වී නොතිබීම.

***සටහන 01*** **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4:1සහ 4:4 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:2 හා 4:3 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතු ය.**

***සටහන 02*** **ඉහත පටිපාටීන්ට පරිබාහිරව පොලිස් රාජකාරි හෝ ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂී දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවකුගේ උස පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධරයාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.**

**4:4 වයස :**

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

*සටහන* - පොලිස් සේවයේ නියුතු නිලධාරිණියක අයදුම්කරන්නේ නම් උපරිම වයස් සීමාව අවුරුදු 28 කි.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

**(i.) මූලික පරීක්ෂණය:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කාරියන් අතරින් සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4:1, 4:2 හා 4:4 (4:3:1 , 4:3:2,4.3.4 ,4.3.7, 4.3.9 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

**(ii.) ඔරොත්තු දීමේ පරීක්ෂණය:**

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කාරියන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ඔරොත්තුදීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. අයදුම්කාරියන් විසින් ඔරොත්තුදීමේ පරීක්ෂණයට මුහුණ දීමට නුසුදුසු නොවන බවට කැඳවීම් ලිපිය සමඟ අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීමේ මීටර /Run meters 1000 | විනාඩි 03 ට අඩු නම් | 30 |
| | විනාඩි 03 ත් 04 ත් අතර | 20 |
| | විනාඩි 04 ත් 05 ත් අතර | 10 |
| | විනාඩි 05 ට වැඩිනම් | අසමත් |
| Chin up (වාර 05 ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Sit up (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Squat Thrust (වාර 15 ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි<br>ධාරණය කර ගැනීමට තත්පර 30 යි<br>ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 කි |

*සටහන :*

1. මීටර් 1000 ක දුරක් විනාඩි 05 ක කාලයක දී දිවීමට අසමත් වන අයදුම්කාරියන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

2. සාමාන්‍ය පොලිස් සේවය සඳහා බඳවාගැනීමේ දී ඉහත අභ්‍යාස වලින් මුලු ලකුණු 50%ක් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙසට සලකනු ලැබේ.

**06. ලිඛිත විභාගය :**

ඔරොත්තුදීමේ පරීක්ෂණය පවත්වා අවසන් වීමෙන් පසු ඉන් සමත්වන අයදුම්කාරියන් සඳහා ලිඛිත විභාගය පවත්වනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40 |

**07.** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කාරියන් අතරින් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කාරියගේ සිට අවරෝහණ ක්‍රමයට සකස් කෙරෙන ප්‍රමුඛතා ලේඛණය අනුව, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ( 1:5) පමණක් අවසන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත් කරනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | 40 |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතාවය | 20 | |
| 05. නායකත්වය / ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී දක්වන කුසලතාවය | 20 | |
| **එකතුව** | 100 | |

08. **පසුබිම් පරීක්ෂණය :**

8:1 ලිඛිත විභාගයෙන් සහ යෝග්‍යතා ඇගයීමේ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කාරියන් ලබාගත් මුලු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කර ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඉන් අනතුරුව පවතින පුරප්පාඩු ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ වන තෙක් අවශ්‍ය අයදුම්කාරියන් ප්‍රමාණයක් පසුබිම් පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

8:2 අයදුම්කාරියන්ගේ අයහපත් චරිතය අනාවරණය කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව අයදුම්කරු පදිංචි පොලිස් ස්ථානය, පොලිස් විශේෂ කාර්යාංශය හා රාජ්‍ය බුද්ධි සේවය මගින් පසුබිම් පරීක්ෂණ වාර්තා කැඳවනු ලබන අතර, එහිදී අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් නුසුදුස්සන් සේ සළකුණු ලැබේ.

**09.** **වෛද්‍ය පරීක්ෂණය :**

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කාරියන් විසින් පොදු 169 පෝරමය සම්පූර්ණ කර පොලිස් රෝහල වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී අයදුම්කරුවන් පොලිස් රාජකාරි ඉටුකිරීම සඳහා සුදුසු බවට සහ ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක රාජකාරී කිරීමට සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද භාජනය කරනු ලැබේ. අයදුම්කාරියන් පොලිස් රෝහල විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. සෞඛ්‍ය 169 පෝරම සහ ශ්‍රී ලංකා පොලිස් පූර්ව පත්වීම් වෛද්‍ය ඇමුණුම හා අන්තරායකර ඖෂධ ජාතික මණ්ඩලය යන වාර්තා අනුව යෝග්‍යතාවය තහවුරු කරන අයදුම්කාරියන් පමණක් පවතින පුරප්පාඩු මත බඳවා ගැනීම සඳහා සලකා බලනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

**10. පුහුණුව :**

10:1 බඳවාගනු ලබන නිලධරයන් පොලිස්පති විසින් නියම කරනු ලබන දිනක දී පුහුණුව සඳහා කැඳවනු ලැබේ.

10:2 මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේදී ලබාදීම සිදුකරනු ලැබේ.

10:3 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරිනියන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීමේ බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. එම තීරණය ප්‍රකාරව මූලික පුහුණුව දීර්ඝ කිරීමක් කළහොත් එම කාලයට සමාන කාල සීමාවකින් පරිවාස කාලය දීර්ඝ කරනු ලැබේ.

**11. සේවා කොන්දේසි :**

11:1 තෝරාගනු ලබන අයදුම්කාරියන් පහත 11:3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු පරිවාස කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

11:2 තෝරාගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින් මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

11:3 පොලිස් ආඥාපනතේ විධිවිධාන ඇතුළුව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කොන්දේසි සහ චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, වෙනත් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුළත් කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

11:4 තුන් (03) අවුරුදු පරිවාස කාලය තුළ, සිටින නිලධාරිණියක සම්බන්ධයෙන් වන සුවිශේෂී කරුණු පිළිබඳව සළකා බලා පොලිස්පති හෝ පොලිස්පති විසින් නම් කරන ලද නිලධරයකුගේ විශේෂ අවසරයක් ඇතුව මිස එම කාලය තුලදී විවාහ විය නොහැක. මෙම රෙගුලාසි උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

11:5 බඳවා ගන්නා අයදුම්කාරියන් බඳවා ගන්නා අවස්ථාවේදී අවුරුදු 05 ක අනිවාර්ය සේවා කාලයක් සඳහා ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හිදී පවත්නා නීති/ ආයතන සංග්‍රහය/ කාර්ය පටිපාටික රීති සහ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

11:6 බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බවට බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

**12. තනතුරේ ස්වභාවය :**

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.)

**13. පත්වීම ස්ථිර කිරීම :**

13:1 පරිවාස කාලය තුළ දී ආධුනික ගොනුවක් පවත්වාගෙන යා යුතුය. පරිවාස කාලය අවසානයේ දී එම නිලධාරිණියන්ගේ සේවය ස්ථිර කිරීම, පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

13:2 පරිවාස කාලයකට යටත්කොට ඇති නිලධාරිණියකගේ පත්වීම ස්ථිර කිරීම, පරිවාස කාලය දීර්ඝ කිරීම හෝ පත්වීම අවසන් කිරීම පවත්නා කාර්ය පටිපාටික රීතීන්හි විධිවිධානයන්ට අනුකූලව පත්කිරීමේ බලධරයා හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලය අභිනියෝජිත බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**14.** කාර්යක්‍ෂමතා කඩඉම :

| *කුමන කාර්යක්‍ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්‍ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්‍ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/ වෘත්තිය පරීක්‍ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්* |
|---|---|---|
| පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම | තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත් කාන්තා උප පොලිස් පරීක්ෂක මුල් පත්වීම් දිනයේ සිට වසර තුනක්(03) ඇතුළත | ලිඛිත , ප්‍රායෝගික හා වාචික |
| දෙවන කාර්යක්‍ෂමතා කඩඉම | කාන්තා පොලිස් පරීක්ෂක තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |
| තුන්වන කාර්යක්‍ෂමතා කඩඉම | කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා ඇති බවට සහතික පත්‍රය ලබා තිබීම |

**15.** භාෂා ප්‍රවීණතාව :

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරිනියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත්වීමට පෙර ලබා ගත යුතු ය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/ 2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

16. මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

17. අයදුම්කාරියන් සුදු පසුබිමේ ලබාගන්නා ලද පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් හා පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් අයදුම්පත් යොමුකරන අවස්ථාවේ දී උඩුගත කළ යුතු ය:

(*අ*) උප්පැන්න සහතිකය
(*ආ*) ජාතික හැඳුනුම්පත
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(*ඈ*) වලංගු රියදුරු බලපත්‍රය
(*ඉ*) අයදුම්කරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට ප්‍රකාශිත ආයතන ප්‍රධානියාගෙන් ලබාගන්නා ලද ලිපිය. (දැනටමත් රැකියාවක නිරතවන්නේ නම් පමණක් අදාළ වේ.) (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතුය)
(*ඊ*) කාන්තා උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා අයදුම්කරන, දැනට පොලිස් සේවයේ නියුතු අයදුම්කාරියකනම් කොට්ඨාසභාර නිලධාරී/අධ්‍යක්ෂ මගින් ලබාගන්නා ලද ලිපිය (අයදුම්පතේ අංක 18 ආකෘතිය යටතේ විය යුතු ය.)
(*උ*) ඔබ රජයේ සේවයෙන් හෝ සන්නද්ධ සේවයෙන් ඉවත්ව ඇත්නම් ඉවත්වීමේ ලිපිය

18. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත යොමුකිරීමේ දී අයදුම්පතේ අනු අංක 18 යටතේ ඇති පහත ආකෘතියට අනුව සකස්කරන ලද ලිපියක් ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව උඩුගත (Upload) කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................................................................................................... මහත්මිය/ මෙනවිය ............................................................ දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ/ මණ්ඩලයේ/ යුධ හමුදා බලකායේ සේවයේ නියුතු අයෙකු බවත්, ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

.........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නම.................................
නිල මුද්‍රාව

දිනය ................................

*සටහන* - **පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.**

ප්‍රියන්ත වීරසූරිය
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

04 - 353/2

---

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරී/නිලධාරිනී තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය සූරියවැව උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ ඉන් පසුව කරන ලද සංශෝධනවලට අනුව, ත්‍රිවිධ හමුදා නිත්‍ය හමුදාවන්ට බඳවාගෙන විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන අදාළ උපාධි වැඩසටහන්වලට අදාළ අධ්‍යයන හා හමුදා සංරචක සාර්ථකව නිම කළ කැඩෙට් නිලධාරීන්ට උපාධි ප්‍රදානය කිරීමට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට බලය පවරා ඇත.

03. අධ්‍යයන, හමුදා සහ අනෙකුත් අවශ්‍යතා සාර්ථකව නිම කිරීමෙන් පසු, ඉහත සඳහන් කැඩෙට් නිලධාරින් ගිවිසුම්/ඇප බැඳුම්කරවල සඳහන් කාල සීමාවක් සඳහා අදාළ නිත්‍ය සේවාවේ අධිකාරියට පත් කරනු ලැබේ.

04. තෝරාගත් කැඩෙට් නිලධාරින් අධ්‍යයන වැඩසටහන් ආරම්භ කිරීමට පෙර උපරිම මාස හයක කාලයක් සඳහා මූලික හමුදා පුහුණුවකට අනුයුක්ත කරනු ලැබේ. තවද, උපාධිය ප්‍රදානය කිරීම සහ අදාළ හමුදා සේවාවන්හි අධිකාරියට පත් කිරීම සඳහා අදාළ හමුදා ඇකඩමිවල (යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව) වසරක උසස් හමුදා පුහුණුවක් සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

05. මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රත්මලාන පරිශ්‍රයෙහි දී පහත පාඨමාලාවන් පැවැත්වේ.

| | *උපාධිය* | *අධ්‍යයන කාලය (වර්ෂ)* |
|---|---|---|
| i. | විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය | 03* |
| ii. | වෛද්‍යවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය | 05 |
| iii. | ගුවන්යානා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| iv. | ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| v. | සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| vi. | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| vii. | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| viii. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| ix. | මෙකාට්‍රොනික් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| x. | නාවික වාස්තුවිද්‍යා හා නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| xi. | නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | 04 |
| xii. | නීතිවේදී උපාධිය | 04* |
| xiii. | විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය | 03* |
| xiv | විද්‍යාවේදී (ගෞරව) කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය | 04 |
| xv | විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධිය | 03* |
| xvi | විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධිය | 03* |
| xvii | වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL) | 03 |
| xviii | විද්‍යාවේදී කළමනාකරණ උපාධිය | 03 |
| xix | විද්‍යාවේදී (ගෞරව) මූල්‍ය විශ්ලේෂණ උපාධිය | 04 |
| xx | විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය | 04 |
| xxi | විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධිය | 04 |
| xxii | විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධිය | 04 |
| xxiii | විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය | 03* |

- මෙම උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුරුවලට අදාළ උපාධි පාඨමාලාවන් අතුරින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - සූරියවැව දක්ෂිණ මණ්ඩප පරිශ්‍රය තුළ පහත පාඨමාලා පැවැත්වේ.

| | *උපාධිය* | *අධ්‍යයන කාලය (වර්ෂ)* |
|---|---|---|
| xxiv | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධිය | 04 |

*** දක්වා ඇති කාල සීමාව තුළට අදාළ විද්‍යාපීඨවල (යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව) වසරක අධ්‍යයන හා හමුදා පුහුණුවක් ඇතුළත් වේ.**

5. 1 උපාධි පාඨමාලාවන් සඳහා බඳවා ගනු ලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ත්‍රිවිධ හමුදාවට අනුයුක්ත කිරීම එම හමුදාවල ඇති පුරප්පාඩු සංඛ්‍යාව සහ තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාව හා එක් එක් හමුදාවට අවශ්‍ය ශාරීරික හා වෙනත් යෝග්‍යතා පදනම් කොට ගෙන සිදුකෙරෙනු ඇත. උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිත්‍ය බල සේනාවල අධිකාරීලත් තනතුරු සඳහා පත්කරනු ලබන්නේ අධ්‍යයන, හමුදා සහ අනෙකුත් අවශ්‍යතා සාර්ථකව නිම කිරීමෙන් ය.

5. 2 නියමිත උපාධි පාඨමාලා සහ හමුදා පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව අදාළ පරිදි ඔවුනට පහත උපාධි පිරිනැමේ.

i. විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධිය
ii. වෛද්‍යවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) උපාධිය

iii. ගුවන්යානා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
iv. ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
v. සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
vi. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
vii. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
viii. යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
ix. මෙකාට්‍රොනික් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
x. නාවික වාස්තු විද්‍යා හා නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
xi. නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය
xii. නීතිවේදී උපාධිය
xiii. විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය
xiv විද්‍යාවේදී (ගෞරව) කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධිය
xv විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධිය
xvi විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධිය
xvii වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL)
xviii විද්‍යාවේදී කළමණාකරන උපාධිය
xix විද්‍යාවේදී (ගෞරව) මූල්‍ය විශ්ලේෂණ උපාධිය
xx විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය
xxi විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධිය
xxii විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධිය
xxiii. විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධිය
xxiv විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධිය

5. 3 සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

5. 4 තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුකූලව පහත දැක්වෙන උපාධි පාඨමාලාවලින් එකක් හැදෑරිය යුතු ය.

**(i) විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ: 3) - (ගැහැණු/පිරිමි)**

2024 (2025) හෝ 2025 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ඕනෑම විෂය ධාරාවක්** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ඕනෑම විෂය ධාරාවක්** හදාරා උපරිම වාර 3 ක දී අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(ii) වෛද්‍යාවේ දී සහ ශල්‍යවෛද්‍යාවේදී (එම්.බී.බී.එස්) උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ පහයි. (වර්ෂ: 5) - (කාන්තා/පිරිමි)**

2025 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව** යන විෂයන් සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් හා සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් (01) සහිතව **ජීව විද්‍යා විෂය** ධාරාව හදාරා (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්නායක/ 2019.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2155/15) අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන්; හෝ

විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව** යන විෂයන් හදාරා G C S E/ G C S E කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඊට සමාන විදේශීය විභාගයකට දේශීයව පෙනීසිට **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පිළිගත් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) සහ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත) අවම ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්නායක/

2019.12.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2155/15) විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(iii) ගුවන්යානා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(iv) ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) (පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(v) සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(vi) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 ක දී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(vii) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** **හෝ 2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය** ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22** **දින සිට 2026.05.31** **දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(viii) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** **හෝ 2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව භෞතීය විද්‍යා විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22** **දින සිට 2026.05.31** **දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

*සටහන:* ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය හැදෑරීමට බඳවා ගන්නා කැඩෙට් නිලධාරින් සඳහා අනිවාර්ය මොඩියුල ලෙස මෝටර් රථ ඉංජිනේරු මොඩියුල හතර තෝරා ගැනීම අනිවාර්ය වේ. එමඟින් නාවික කැඩෙට් නිලධාරීන්ට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මෙහෙයුම් සහ ඉංජිනේරු ඉල්ලීම් සපුරාලීම සඳහා අවශ්‍ය විශේෂිත දැනුම සහ තාක්ෂණික නිරාවරණය ලබා ගත හැකිය.

**(ix) මෙකාට්‍රොනික් ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (පිරිමි)**

**2024 (2025)** **හෝ 2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය** ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22** **දින සිට 2026.05.31** **දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(x) නාවික වාස්තුවිද්‍යා හා නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** **හෝ 2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය** යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22** **දින සිට 2026.05.31** **දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(xi) නාවික ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ:4) - (කාන්තා/පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව** යන විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් සහිතව **භෞතීය විද්‍යා විෂය** ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය යන විෂයයන් සමග උපරිම වාර 3 කදී අවම වශයෙන් **"B"** සාමාර්ථ්‍යය දෙකක් (02) හා **"C"** සාමාර්ථ්‍යය එකක් (01) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(xii) නීතිවේදී උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) (කාන්තා/පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යා හෝ වාණිජ හෝ කලා* හෝ වෙනත්* විෂයය ධාරා (කොන්දේසි අදාළ වේ)** යටතේ පහත සඳහන් විෂයයන් හදාරා අවම වශයෙන් සම්මාන සාමාර්ථ්‍යය (C) දෙකක් සහ සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) එකක් ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් ලබා හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **පහත සඳහන් විෂයයන්** හදාරා අවම වශයෙන් ''C'' සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට හෝ උපරිම වාර 3 කදී ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක සඳහන්ව තිබිය යුතු ය.

**පහත ලැයිස්තුවෙන් විෂයයන් තුනම හෝ දෙකක් හෝ අවම වශයෙන් එකක් හදාරා තිබිය යුතු ය.**

| | |
|---|---|
| ගිණුම්කරණය | ජීව විද්‍යාව |
| කෘෂි විද්‍යාව | භූගෝල විද්‍යාව |
| මනෝ විද්‍යාව | උසස් ගණිතය |
| ව්‍යාපාර සංඛ්‍යානය | නීතිය |
| ව්‍යාපාර අධ්‍යයනය | තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය |
| ඉතිහාසය | ආර්ථික විද්‍යාව |
| භෞතික විද්‍යාව | රසායන විද්‍යාව |
| පරිගණක විද්‍යාව | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය |
| ගණිතය/ සංයුක්ත ගණිතය | සමාජ විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |

*සහ*

**පහත ලැයිස්තුවෙන් අනෙක් විෂය/ විෂයයන් දෙක හදාරා තිබිය යුතු ය.**

| | |
|---|---|
| බුද්ධ ධර්මය / බෞද්ධ ශිෂ්ටාචාරය | ස්පාඤ්ඤ භාෂාව |
| දෙමළ | ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය |
| හින්දු ධර්මය / හින්දු ශිෂ්ටාචාරය | සංස්කෘත |
| ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | ඉස්ලාම් / ඉස්ලාම් ශිෂ්ටාචාරය |
| ප්‍රංශ භාෂාව | ජපන් |
| චීන භාෂාව | සිංහල |
| ඉංග්‍රීසි (විෂය අංක 73) | පාලි |
| අරාබි භාෂාව | ජර්මන් |
| ඉංග්‍රීසි සාහිත්‍ය | හින්දි භාෂාව |
| ශාස්ත්‍රීය අධ්‍යයනය | ගෝලීය දර්ශනය සහ පර්යේෂණ |
| රුසියානු භාෂාව | |

★ ඊට අමතරව අපේක්ෂකයන් අ.පො.ස. (සා/පෙළ.) විභාගයේදී සිංහල/දෙමළ විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතුය.

★ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ තෝරාගනු ලබන සිසුන් බඳවාගත් දින සිට වසර දෙකක් (02) ඇතුළත අ.පො.ස. (සා/පෙළ) විභාගයේ සිංහල/දෙමළ භාෂාව සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබාගත යුතුය.

**(xiii) විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව** යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් අනිවාර්ය වන අතර **සංයුක්ත ගණිතය, උසස් ගණිතය, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) දෙකක් සහිතව **භෞතීය විද්‍යා හෝ වෙනත්*** විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

***වෙනත් විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් හදාරා තිබීම අනිවාර්ය වේ.**

**(xiv) විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (කාන්තා/ පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ දී අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව** යන විෂයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් අනිවාර්ය වන අතර **සංයුක්ත ගණිතය, උසස් ගණිතය, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** යන විෂයයන්ගෙන් විෂයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) දෙකක් සහිතව **භෞතීය විද්‍යා හෝ වෙනත් විෂය ධාරාව** යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

***වෙනත් විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් හදාරා තිබීම අනිවාර්ය වේ.**

**(xv) විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (කාන්තා/ පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ දී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් **සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව** යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් අනිවාර්ය වන අතර **සංයුක්ත ගණිතය, උසස් ගණිතය, ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) දෙකක් සහිතව **භෞතීය විද්‍යා හෝ වෙනත් විෂයය ධාරාව*** යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

***වෙනත් විෂය ධාරාව යටතේ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක් හදාරා තිබීම අනිවාර්ය වේ.**

**(xvi) විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)**

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය** ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී **ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය** ධාරාව හදාරා අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

*** භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

**(xvii) විද්‍යාවේදී (ගෞරව) කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය** ධාරාව හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී **ජීව විද්‍යා හෝ භෞතීය විද්‍යාව විෂය** ධාරාව හදාරා අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

***භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව විෂයයන් හදාරා තිබීම අනිවාර්යය වේ.**

**(xviii) විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)**

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා, භෞතීය විද්‍යා හෝ වාණිජ විෂය ධාරාව** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ජීව විද්‍යා, භෞතීය විද්‍යා හෝ වාණිජ විෂය** ධාරාව හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(xix) විද්‍යාවේදී සමාජ විද්‍යා උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ තුනයි. (වර්ෂ: 3) - (කාන්තා/පිරිමි)**

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ඕනෑම විෂය ධාරාවක් හදාරා** විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ඕනෑම විෂය ධාරාවක්** හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් "D" සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(xx) වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව (TESOL) : කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ: 3) - (පිරිමි)**

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ඕනෑම විෂය ධාරාවක්** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන්

හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ඕනෑම විෂයය ධාරාවක්** හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සළකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම "B" සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.;

*නැතහොත්*

කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) විභාගයෙන් ඉංග්‍රීසි විෂයට අවම "B" සාමාර්ථ්‍යයක් ලබා තිබිය යුතු ය.

(xxi) විද්‍යාවේදී (ගෞරව) කළමනාකරණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4) - (ගැහැණු/පිරිමි)

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා, භෞතීය විද්‍යා, තාක්‍ෂණවේදය හෝ වාණිජ විෂය ධාරාවක්** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ඕනෑම විෂය ධාරාවක්** හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

**(xxii) විද්‍යාවේදී (ගෞරව) මූල්‍ය විශ්ලේෂණ උපාධි පාඨමාලාව : කාලසීමාව වර්ෂ හතරයි. (වර්ෂ: 4) - (පිරිමි)**

**2024 (2025)** හෝ **2025** වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව **ජීව විද්‍යා, භෞතීය විද්‍යා හෝ වාණිජ විෂය ධාරාවක්** හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ **ජීව විද්‍යා, භෞතීය විද්‍යා විෂය ධාරාවක්** හදාරා උපරිම වාර 3 කදී අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

ඊට අමතරව, අපේක්‍ෂකයන් අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී පහත සඳහන් අවශ්‍යතාවයන් ද සපුරා තිබිය යුතු ය.;

ගණිතය විෂයයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ්‍යයක්;

*හෝ*

කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් සාමාන්‍ය පෙළ (Cambridge/ Edexcel O/L) හෝ ඒ හා සමාන විභාගයකින් ගණිතය විෂයයට අවම වශයෙන් "C" සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

(xxiii) විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති උපාධි පාඨමාලාව :කාලසීමාව වර්ෂ තුනයි (වර්ෂ:3) - (පිරිමි)

**2024 (2025)** හෝ **2025** වසරවල අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් **ජීව විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ, කලා හෝ වෙනත් විෂය ධාරාවන් (කොන්දේසි අදාළ වේ)** යටතේ පහත සඳහන් විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) තුනක් (03) සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී පහත සඳහන් විෂයයන් තුනකට (03) අවම වශයෙන් **"D"** සාමාර්ථ්‍යය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින දක්වා** කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

පහත සඳහන් A ලැයිස්තුවෙන් විෂයයන් එකක් හෝ විෂයයන් දෙකක් හා B ලැයිස්තුවෙන් අනෙක් එක් විෂයයක්/ විෂයයන් දෙකක් සහිතව සමත් වී තිබිය යුතු ය.

*A ලැයිස්තුව*

ගිණුම්කරණය
භූගෝල විද්‍යාව
ව්‍යාපාර සංඛ්‍යානය
තර්ක ශාස්ත්‍රය සහ විද්‍යාත්මක ක්‍රමය
භෞතික විද්‍යාව
සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
දේශපාලන විද්‍යාව
ජීව විද්‍යාව
මනෝ විද්‍යාව
සමාජ විද්‍යාව
රසායන විද්‍යාව
ගණිතය/ සංයුක්ත ගණිතය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
කෘෂි විද්‍යාව
උසස් ගණිතය
ව්‍යාපාර අධ්‍යයනය
ආර්ථික විද්‍යාව
ඉතිහාසය
නීතිය
පරිගණක විද්‍යාව

*B ලැයිස්තුව*

බුද්ධාගම / බෞද්ධ ශිෂ්ටාචාරය

හින්දි භාෂාව
ක්‍රිස්තියානි ආගම / ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය
ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය
ජපන් භාෂාව
ඉංග්‍රීසි (විෂය අංක 73)
සංස්කෘත භාෂාව
හින්දු ආගම/හින්දු ශිෂ්ටාචාරය භාෂාව
ශාස්ත්‍රීය අධ්‍යයනය
ඉංග්‍රීසි සාහිත්‍ය
ස්පාඤ්ඤ භාෂාව
නර්තනය
සංගීතය (පෙරදිග/අපරදිග)
ඉස්ලාම් ආගම / ඉස්ලාම් ශිෂ්ටාචාරය
චීන භාෂාව
පාලි භාෂාව
ජර්මන් භාෂාව
දෙමළ භාෂාව
ප්‍රංශ භාෂාව
සිංහල භාෂාව
අරාබි භාෂාව
රුසියානු භාෂාව
ගෝලීය දර්ශනය සහ පර්යේෂණ
කෘෂි තාක්ෂණය
චිත්‍ර
නාට්‍ය හා රංග කලාව
කොරියානු භාෂාව

**මීට අමතරව අයදුම්කරුවන්,**

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ විෂයයන්ට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(xxiv) විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව: කාලසීමාව වර්ෂ හතරයි (වර්ෂ: 4)- (පිරිමි)

**2024 (2025) හෝ 2025** වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථය (S) තුනක් (03) **සහිතව ජීව විද්‍යාව, භෞතීය විද්‍යාව, වාණිජ, කලා හෝ වෙනත් විෂය ධාරාවන්** යටතේ හෝ **තාක්ෂණවේදය*** විෂයය ධාරාව යටතේ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය** විෂයය සමග වෙනත් විෂයයන් දෙකක් හදාරා විශ්වවිද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැබූ සිසුන් හෝ විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ උපරිම වාර 3 කදී ජීව විද්‍යා, ගණිත, වාණිජ හෝ කලා විෂය ධාරාවන් යටතේ අවම වශයෙන් **"D"** සාමාර්ථය තුනක් (03) සහිතව **2025.06.22 දින සිට 2026.05.31 දින** දක්වා කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනී සිට ප්‍රතිඵල ලබා ඇති සිසුන් පමණක් සලකා බලනු ලැබේ. විභාග ප්‍රතිඵල එක්වර එක් ප්‍රතිඵල ලේඛනයක ලබාගෙන තිබිය යුතු ය.

***තාක්ෂණවේදය විෂයය ධාරාව යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය විෂය හදාරා තිබීම අනිවාර්ය වේ.

5. 5 තෝරාගනු ලබන කෙඩෙට් නිලධාරීන්/ නිලධාරිනියන් ඒ ඒ උපාධි පාඨමාලාවට අදාළ වන පොදු විෂයයන් හා ඉංග්‍රීසි හා හමුදා විෂයයන් හැදෑරීම අනිවාර්ය වේ.

5. 6 මීට අමතරව ශාරීරික වර්ධනය, සරඹ හා අවි පුහුණුව, නායකත්වය ආදිය පිළිබඳව ද පාඨමාලා කාලය තුළදී අඛණ්ඩ පුහුණුවීම් වල යෙදිය යුතු ය.

**06. (අ) උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරි/නිලධාරිනි තනතුර සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම්**

*අයදුම්කරු*

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු වේ.

(ii) 2025.12.31 වෙනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 22 ට නොවැඩි විය යුතු වේ.

(iii) අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් අවස්ථා 03 ක් තුළ සමත් වී තිබීම.
(අවම ලකුණු - 30).

(iv) අ.පො.ස (උ/පෙළ) අපේක්ෂකයෙකු නම් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලැබූවකු විය යුතු වේ.

(v) අවිවාහක විය යුතු වේ. (උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුට/ නිලධාරිනියකට පුහුණුවීම් කාලය තුළදී විවාහ වීමට අවසර නොමැති අතර සේවා රෙගුලාසි මගින් අවකාශ සැලසෙන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.)

(*ආ.*) අධ්‍යාපන සුදුසුකම් :-

(i) 2024 (2025) හෝ 2025 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිට (වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (එම්.බී.බී. එස්) උපාධිය හැර) ප්‍රතිඵල ලබා ඇති අයදුම්කරුවන්ට අයදුම් කළ හැකිය. වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (එම්.බී.බී. එස්) උපාධිය සඳහා 2025 වර්ෂයේදී අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල ලබා ඇති අයදුම්කරුවන්ට පමණක් අයදුම් කළ හැකිය.

(ii) 2025.06.22 සිට 2026.05.31 දක්වා කාලය තුළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විදේශීය විභාග සඳහා එකවර පෙනී සිට ප්‍රතිඵල ලබා ඇති, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සියලුම උපාධි පාඨමාලා සඳහා අයදුම් කිරීමට සලකා බලනු ලැබේ.

(iii) TESOL උපාධි පාඨමාලාව හැර සෙසු සියලුම උපාධි පාඨමාලා සඳහා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ කේම්බ්‍රිජ්/එඩෙක්සෙල් (Cambridge/ Edexcel O/L) හෝ ඒ හා සමාන විභාගයකින් ඉංග්‍රීසි භාෂාව විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය. TESOL උපාධි පාඨමාලාව සඳහා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ (Cambridge/ Edexcel O/L) හෝ ඒ හා සමාන සාමාන්‍ය පෙළ විභාගයකින් ඉංග්‍රීසි භාෂාව විෂය සඳහා අවම වශයෙන් (B) සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(iv) ශ්‍රී ලංකා යුධ හමුදාව/ නාවික හමුදාව හා ගුවන් හමුදාව වෙත සුදුසුකම් ලැබීමට පහත නිර්ණායකයන්ද සපුරා තිබිය යුතු ය.

සියලුම උපාධි පාඨමාලා සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ සිංහල/දෙමළ භාෂාව යන විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ (C) 06 ක් සමඟ විෂයන් 08ක් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් විය යුතුය (අතිරේක හා විකල්ප විෂයයන් අදාළ නොවේ).

(v) විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ කේම්බ්‍රිජ්/ එඩෙක්සෙල් උසස් පෙළ (Cambridge/ Edexcel A/L) හෝ ඒ හා සමාන විභාගයකට පෙනීසිටි සිසුන් අවම වශයෙන් අපොස (සා/පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ භාෂා විෂයට සම්මාන සාමාර්ථ (C) ලබා තිබිය යුතුය (තෝරාගත් උපාධි පාඨමාලා සඳහා පමණක් අදාළ වේ).

විදේශ අධ්‍යාපන සුදුසුකම් යටතේ අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවෙකු, අයදුම් කරන මොහොතේ දී ඉහත සුදුසුකම සපුරා නොමැති නම් ඔහුව/ඇයව කෙඩෙට් නිලධාරියෙකු ලෙස බඳවාගත් දින සිට වසර දෙකක් ඇතුළත අපොස (සා/පෙ) විභාගයට පෙනීසිට සිංහල/දෙමළ භාෂාව විෂයට සම්මාන සාමාර්ථයක් (C) ලබාගත යුතු යි.

ඉහත සුදුසුකම නියමිත වසර දෙක තුළදී සපුරනු නොලබන කෙඩෙට් නිලධාරීන්/නිලධාරිනියන් අදාළ සේවයෙන් ඉවත් කරනු ලැබේ.

(*ඇ.*) පහත සඳහන් අවම ශාරීරික මිනුම් (සම්මතයන්) සපුරාලිය යුතු ය.

| | *යුද* | | *නාවික* | | *ගුවන්* | |
|---|---|---|---|---|---|---|
| | *පුරුෂ* | *ස්ත්‍රී* | *පුරුෂ* | *ස්ත්‍රී* | *පුරුෂ* | *ස්ත්‍රී* |
| උස | 5' 6" (සෙ. මී. 167.5) | 5' 3" (සෙ. මී. 162) | සෙ. මී. 168 (සෙ. මී. 170 Provost Branch) | සෙ. මී. 160 (සෙ. මී. 163 Provost Branch) | 5' 5" (සෙ. මී. 165 සහ ඉන් ඉහළ) | 5' 3" (සෙ. මී. 160 සහ ඉන් ඉහළ) |
| බර | කි. ග්‍රෑ. 52 (රාත්තල් 118) | කි. ග්‍රෑ. 45 | කි. ග්‍රෑ. 52 | කි. ග්‍රෑ. 41 | - | - |
| ශරීර ස්කන්ධ දර්ශකය | 18.5 – 25 කි. ග්‍රෑ. | | 17 - 27 | | <26 සහ >17 | <25 සහ >17 |
| පපුව | 32" | - | සෙ. මී. 81.28 | - | 32" (අවමය සෙ. මී. 81) | - |

**පෙනීම**

| | *යුද* | | | *නාවික* | | | *ගුවන්* | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | *Master Eye* | *Other Eye* | *CP* | *Master Eye* | *Other Eye* | *CP* | *Master Eye* | *Other Eye* | *CP* |
| උපැස් රහිත | 6/6 | 6/9 | CP 2 | 6/6 | 6/6 | CP 2 | 6/6 | 6/6 | CP 2 |
| ආසන්න දෘශ්‍යීය | - | - | - | By Jaegar chart 01 | | | - | - | - |

**විශේෂ සටහන :-**

* යම් අයදුම්කරුවෙකු වයස අවුරුදු 17න් පහළ /19 න් පහළ ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා හෝ වර්ණ ලබා ඇත්නම්, හෝ ජනාධිපති/අගමැති බාලදක්ෂයෙකු/දක්ෂිකාවක නම්, හෝ පාසල් ශිෂ්‍යභට කණ්ඩායමේ යටත් නිලධාරියෙකු (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ) නම්, හෝ ශිෂ්‍යභට සැරයන් හෝ ඉන් ඉහළ තනතුරක් දරා ඇත්නම්, ඉහත සඳහන් ශාරීරික මිනුම් පිළිබඳ අවශ්‍යතාවයන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත් කරනු ලබන අවසාන සම්මුඛ පරීක්ෂණ තේරීම් කමිටුව විසින් ලිහිල් කිරීමට අවකාශය ඇත.

මෙහිදී යම් අයදුම්කරුවෙකු වයස අවුරුදු 17න් පහළ /19 න් පහළ ජාතික මට්ටමේ ක්‍රීඩා ජයග්‍රහණ ලබා ඇත්නම්, ඔහු/ඇය ඔහු/ඇය පහත පරිදි ස්ථාන ලබා තිබිය යුතුය.

කේවල තරග - 1 වන/ 2 වන/ 3 වන ස්ථාන
කණ්ඩායම් තරග - ශූරතාව / ප්‍රථම අනුශූරතාව

*අයදුම්කරුවෙකු අදාළ සේවාවන් (යුද, නාවික හෝ ගුවන් හමුදා) මගින් නියමකර ඇති දෘෂ්ටි තීව්‍රතාවය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා තිබීම අනිවාර්ය වේ.

ඈ. අයදුම්කරු මනා සෞඛ්‍යය තත්ත්වයක සිටිය යුතු අතර ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම මෙන්ම පිළිගත් ආකෘතියට අනුව සකසන ලද සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීම අවශ්‍යය වේ. තවද, අධ්‍යයන පාඨමාලාවට තේරී පත්වීමට පෙර යම් අයදුම්කරුවෙක් විසින් සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රයෙහි අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එවැනි අයදුම්කරුවෙක් අධ්‍යයන කටයුතු සඳහා නුසුදුස්සකු වන අතර අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

සෞඛ්‍යය ප්‍රකාශන හා පරීක්ෂණ ආකෘති පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) ලබා ගත හැකිය.

7. **සේවා කොන්දේසි:-** තෝරාගනු ලබන අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රත්මලාන, සූරියවැව දක්ෂිණ මණ්ඩපය හෝ මෙට්‍රොපොලිටන් මණ්ඩපය කොළඹ සඳහා උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන් ලෙස බඳවා ගැනේ. ඔවුන් 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත සහ එම පනතේ සහ එහි පසුකාලීන සංශෝධන යටතේ පනවනු ලැබූ නීති, රීති සහ අදාළ සේවාවන් (යුද, නාවික හෝ ගුවන් හමුදා) යටතේ සකස් කරන ලද හෝ ලබා දී ඇති නීති, රෙගුලාසි සහ නියෝග යටත් විය යුතුය.

වෛද්‍ය උපාධි පාඨමාලාව සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්වූ දින සිට ඔහු හෝ ඇය අඛණ්ඩ සහ නිරන්තර අනිවාර්ය වසර 20 කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතු ය.

අනෙකුත් උපාධි පාඨමාලාවන් සඳහා බඳවාගනු ලබන අපේක්ෂකයන් නිත්‍ය සේවාවේ අධිකාරියට පත් වූ දින සිට අනිවාර්ය වසර 12කට නොඅඩු සේවා කාලයක් සේවය කළ යුතුවේ.

ඊට අමතරව, මූලික, අධ්‍යයන හෝ උසස් හමුදා පුහුණු කාලසීමාව තුළ වෛද්‍ය හේතූන් මත හෝ විනය හේතූන් මත හෝ වෙනත් ඕනෑම කොන්දේසියක් මත සේවයෙන් ඉවත් කරන ලද කිසිදු කැඩෙට් නිලධාරියෙකුට උපාධිය පිරිනමනු නොලැබේ.

8. බඳවාගනු ලබන අපේක්ෂකයින් නිත්‍ය සේවාවේ අධිකාරියට පත්කිරීම හා අදාළ උපාධිය ලබා ගැනීමෙන් පසුව එම සේවාවන්ට අදාළවන පරිදි අනිවාර්ය සේවා කාලයක් සේවය කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

9. උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරියෙකුගේ/නිලධාරිනියකගේ මාසික වැටුප ආසන්න වශයෙන් රු. 105,000/- ක් (සලාක දීමනා සහ අදාළ වෙනත් දීමනා ඇතුළත්ව) පමණ වේ. මෙයට අමතරව පහත සඳහන් පහසුකම් ද සපයනු ලැබේ.

I. නවාතැන් පහසුකම්,
II. නිල ඇඳුම්,
III. අනුගාමික සේවාවන්,
IV. ක්‍රීඩා හා විනෝද පහසුකම්,
V. වෛද්‍ය පහසුකම්.

10. ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ නිත්‍ය සේවාවන්හි අධිකාරියට පත්කිරීමෙන් අනතුරුව ඔවුන් තම පදවිවලට අදාළවන පරිදි එම සේවාවන්හි බලපාන වැටුප් සහ දීමනා සඳහා හිමිකම් ලබනු ඇත.

අ. පහත සඳහන් මාසික දීමනාවන්ද ගෙවනු ලැබේ.

I. සුදුසුකම් දීමනා,
II. ආහාර දීමනාව,
III. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාවක් (විවාහක නිලධාරින්ට පමණක්),
IV. නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ./ දීමනා ගෙවනු ලැබේ.

I. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලයේ නේවාසික පහසුකම්,
II. විවාහක නිලධාරින් සඳහා ලබාදෙන සීමිත ගෙවල් කුලී දීමනාව,

III. නිල ඇඳුම් දීමනා,
IV. විවාහක නිලධාරින්ට අනුගාමික දීමනා/ අවිවාහක නිලධාරින්ට අනුගාමික සේවය.

11. ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා වැටුප් හා සේවා කොන්දේසි පහත සඳහන් රෙගුලාසි මගින් පාලනය වනු ඇත.

*අ.* යුධ හමුදා/නාවික හමුදා/ ගුවන් හමුදා වැටුප් සංග්‍රහය
*ආ.* යුධ හමුදා/ නාවික හමුදා/ගුවන් හමුදා නිලධාරින් උදෙසා ශ්‍රී ලංකා *ගැසට්* පත්‍රයේ පළ කරනු ලබන වලංගු රෙගුලාසි
*ඇ.* ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළ කරන වලංගු යුධ හමුදා/ නාවික හමුදා/ ගුවන් හමුදා සහ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය

12. පුහුණුවීම් කාලය තුළදී උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ/හෝ අදාළ හමුදාපතිවරු විසින් නියම කරනු ලබන පුහුණුවීම්වල නිරත විය යුතු වේ.

13. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඕනෑම ප්‍රදේශයකට පත්කොට යැවිය හැකිය.

14. පුහුණුව ලබන උපාධි අපේක්ෂක කෙඩෙට් නිලධාරින්/නිලධාරිනියන් ඔවුන් සඳහා වෙන් කොට ඇති නේවාසික ස්ථානයන්හි සිටිය යුතු අතර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හෝ අදාළ වෙනත් සේවා ආයතන මගින් පනවන ලද දින චර්යාවන් අනුගමනය කළ යුතු වේ.

15. **භාෂා අවශ්‍යතා -** තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් මේ දක්වා පනවනු ලැබ ඇත්තාවූද ඉදිරියේදී පනවනු ලැබිය හැකිවූද නීතින්ට අනුකූලව කටයුතු කළ යුතු වේ.

16. **අනන්‍යතාවය ඔප්පු කිරීම :-** අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ ගුවන් ගමන් බලපත්‍රය හෝ තැපැල්පති විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

17. (I) **අයදුම්පත් :-** මේ සඳහා අයදුම් කළ හැකි වනුයේ මෙම විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය (www.kdu.ac.lk) ඔස්සේ විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම මගින් පමණි (අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි දක්වා ඇත). තැපැල් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

(II) මෙම විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කර එක් උපාධි පාඨමාලාවක් සඳහා නැවත නොගෙවනු ලබන රුපියල් දෙදහසක (රු. 2,000) මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස මාර්ගගත ක්‍රමයට (Online Payment) ගෙවිය යුතු ය.

18. අවශ්‍ය මූලික සුදුසුකම් නොමැති හෝ ඉල්ලුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොමැති හෝ මෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවන හෝ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරෙන අතර අයදුම්පත් එවීමේ දී ගෙවනු ලැබූ මුදල් කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ. උපකුලපතිතුමා විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මඟින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් සිදු කරනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පමණක් මූලික සම්මුඛ පරීක්ෂණ සහ ඉදිරියේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

මෙලෙස ඔබ විසින් සම්පූර්ණ කරනු ලබන විද්‍යුත් අයදුම්පත් **2026.05.31** හෝ එදිනට පෙරාතුව ලැබෙන සේ **විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය ඔස්සේ යොමුකළ යුතු ය.** ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත්‍ර සහ මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

19. රාජ්‍ය හෝ සංස්ථා සේවයෙහි නිරත නිලධාරියෙකු/ නිලධාරිනියක අයදුම්පත් ඉදිරිපත්කර, එකී අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය අදාළ තනතුරෙන් නිදහස් කළ හැකි බව සඳහන් අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද තිබිය යුතු ය.

20. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය මගින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මඟින් තීරණය කරනු ලබන්නා වූ නිර්ණායකයන්ට අනුකූලව ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් මූලික තේරීම් කරනු ඇත. මෙසේ තෝරා ගනු ලබන්නා වූ අපේක්ෂකයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් අවශ්‍යයයි තීරණය කරනු ලබන්නා වූ වෙනත් පරීක්ෂණයන්ටද පෙනී සිටිය යුතු වේ.

21. සම්මුඛ පරීක්ෂණ සහ නිලධාරී තත්ත්ව පරීක්ෂණය (OQT) සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට එවැනි සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන ස්ථාන, වේලාවන්, දිනයන් සහ අනෙකුත් උපදෙස් පිළිබඳව KDU වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් වියදම් අයදුම්කරුවන්ට ගෙවනු නොලැබේ.

22. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් නිළධාරී යෝග්‍යතා පරීක්ෂණයේ දී හෝ හමුදා පුහුණුව අතරතුර අයදුම්කරුවන් හට සිදුවන කිසිදු ආකාරයක ආබාධ තත්ත්වයක වගකීමක් නොගන්නා අතර කිසිදු අයදුම්කරුවෙකුට කිසිදු තත්ත්වයකදී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හෝ ශ්‍රී ලංකා රජය කිසිදු වන්දියක් හෝ නොගෙවන අතර වගකීමක් නොගනී.

23. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරනු ලබන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට ඒ පිළිබඳව සහතිකයක් ලබා දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම හෝ නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

24. අයදුම්පත් ලැබුණු බවට විද්‍යුත් ආකාරයෙන් දැනුම් දෙනු ලැබේ. සුදුසුකම් මත පදනම් වූ තරඟකාරී තේරීමක් හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලිපි හුවමාරුවක් හෝ විමසීමක් සිදු නොකෙරේ.

25. ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය), එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩියූ (චීනය), පීඑස්සී
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සහ
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ
කළමනාකරණ මණ්ඩලයේ සභාපති.

04 - 409

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයේ කාර්මික නිලධාරී (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයට අයත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී තනතුරු දොළහක් (12) සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (මෙම තනතුර සඳහා සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට 2026.04.30 දින ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අනුව බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොසිටිය හොත් එම තනතුරු ප්‍රමාණයද මෙම දැන්වීම අනුව පැවැත්වෙන විවෘත තරග විභාගය මගින් තෝරා ගන්නා ලද බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කිරීමට නියමිතයි)

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.05.25 දින වන අතර එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

03. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව MN 3 – 2025 වැටුප් ඛණ්ඩයට අයත්

රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 - රු. 100,040/= වැටුප් පරිමාණය අදාළ වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් (III ශ්‍රේණිය - විවෘත) :

4.1 අධ්‍යාපන සුදුසුකම්:

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිත විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය/ව්‍යවහාරික ගණිතය/සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව

හෝ තාක්ෂණවේදය විෂයය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් එකවර සමත් වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

4.2 *වෘත්තීය සුදුසුකම් :*

I. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම (සිවිල්) ;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ – 06) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්) ;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. (සිවිල් අංශයෙන්)

4.3 *වෙනත් සුදුසුකම් :*

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය;
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි;
iv. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

***සැලකිය යුතුයි.-*** අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන විට සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් වරින් වර නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා ඔබ විසින් දායක මුදල් ගෙවිය යුතු ය.

ii. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

iii. දැනට බලාත්මක බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා ඉදිරියේදී කරනු ලැබිය හැකි බඳවා ගැනීම් පටිපාටියේ සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පත්වීම් බලධාරියා තීරණය කරනු ලබන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ

පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

6.1 *ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය :*

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 50% |

6.2 *විෂය නිර්දේශය :*

i. *බුද්ධි පරීක්ෂණය .-* අපේක්ෂයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයත්, ඔවුන්ගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

ii. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය .-* මූලික ගණිතමය දැනුම හා මූලික සිවිල් ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

07. භාෂා ප්‍රවීණතාවය :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

08. ශ්‍රේණි උසස් කිරීම :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

09. කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

10. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

10.1 අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිතා කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාදවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.2 අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

10.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2026.05.25** දිනට පෙර එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යනුවෙන් සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ යන ලිපිනයට එවිය යුතු ය.

10.4 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.5 විභාග ගාස්තුව රු. 2,000/= කි. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ලංකා බැංකුව, තලවතුගොඩ ශාඛාව, ගිණුම් අංක 7040440 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවන සේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කුමන කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

10.6 දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

11. විභාග පරිපාටිය :

11.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත

සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් යොමු කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් www.dncws.lk වෙබ් අඩවිය හරහා වෙබ් නිවේදනයක් මඟින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය වෙතින් විමසිය යුතු ය. එසේ විමසීමේ දී ඔබ වෙත තබා ගත් අයදුම්පතේ පිටපතක් ද විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපතක් ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමග ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර සිටීම වඩාත් ඵලදායිවනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී/සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

11.2 විභාගය සිංහල, දෙමළ හා අවශ්‍යතා පරිදි ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

11.3 විභාගයට පෙනී සිටින ලද මාධ්‍ය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

11.4 මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය 2026 ජූලි මාසයේ දී පවත්වනු ලැබේ.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ලැබේ :-

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙස් විභාග ප්‍රවේශ පත්‍රය මගින් ඔබට දන්වනු ලැබේ. විභාග සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළුකර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතුවේ.

13. අත්සන සහතික කිරීම :

අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, රජයේ හෝ රාජ්‍ය සේවයේ ස්ථිර, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**එම්.එම්. ආනන්ද විජිත කුමාර මාපා,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 අප්‍රේල් මස 30 දින,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
අංක 1114,
පන්නිපිටිය පාර
තලවතුගොඩ.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 1

දෙමළ - 2

ඉංග්‍රීසි - 3

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./Mrs./Miss ..........................................................................

..........................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: Mr./Mrs./Miss. SILVA A.B.

1.2 සම්පූර්ණ නම : ..........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය : ..........................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................

2.2 ස්ථිර ලිපිනය : ..........................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................

03. 3.1 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවු: ............ මාස : ............ දින : ............

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. ස්ත්‍රී/පුරුෂ භාවය: පුරුෂ - 0 ස්ත්‍රී - 1

06. විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2)

07. දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

08. විද්‍යුත් ලිපිනය (email address) : .............................................

09. සුදුසුකම් :

9.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :

..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

9.2 වෘත්තීය සුදුසුකම් :

..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

10. ඔබ අධිකරණය ඉදිරියේ වරදකරුවකු වී තිබේ ද? ...................................................

වරදකරුවකු වී තිබේ නම් විස්තර සඳහන් කරන්න :

..............................................................................................................................................................
..............................................................................................................................................

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

11.1 විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : .........................................................

11.2 ලදුපත් අංකය හා දිනය : .........................................................

11.3 ගෙවූ මුදල : ........................................................

| මුදල් ගෙවූ ලදුපත නොගැළවෙන සේ මෙහි අලවන්න. |
|---|

12. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකුවීමට යටත්වන බවත්, තෝරා පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීති රීති වලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

දිනය :- .............................................

අයදුම්කරුගේ අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................................................................................යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ................................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

.............................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා (අනවශ්‍ය වචන කපා හරින්න) :

ඉහත විස්තර සඳහන් ................................................................................ මහතා/මහත්මිය/මෙනවිය ...................................... .................................................. (ආයතනය) සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

දිනය :- ....................................

.....................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.
(නිල මුද්‍රාව)

04 - 354/1

---

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

01. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයට අයත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරු පහක් (05) සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.05.25** දින වේ.

03. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව MN 3 – 2025 වැටුප් ඛණ්ඩයට අයත් රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 - රු. 100,040/= වැටුප් පරිමාණය අදාළ වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් (III ශ්‍රේණියට සෘජු බඳවා ගැනීම්) :

4.1 *අධ්‍යාපන සුදුසුකම්:*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් (06) කින් සමත්වීම.

4.2 *වෘත්තීය සුදුසුකම්:*

I. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්);

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම (සිවිල්);

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ – 06) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්) ;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. (සිවිල් අංශයෙන්)

4.3 *සේවා පළපුරුද්ද :*

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සටහන :* සතුටුදායක සේවා කාලය යනු පූර්වාසන්න වසර 05 තුළ උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම සහ පූර්වාසන්න වසර 05 ක් තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීමයි.

4.4 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.5 *වෙනත් සුදුසුකම් :*

i. අයදුම්පත් කැඳවන දිනට පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

ii. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.
ii. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.
iii. මෙම පත්වීම එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පත්වීම් බලධාරියා තීරණය කරනු ලබන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

6.1 *ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය :*

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 50% |

6.2 විෂය නිර්දේශය :

i. *බුද්ධි පරීක්ෂණය .-* අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයත්, ඔවුන්ගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

ii. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය .-* මූලික ගණිතමය දැනුම හා මූලික සිවිල් ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහාවන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

07. භාෂා ප්‍රවීණතාවය :
ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

08. ශ්‍රේණි උසස් කිරීම :
ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

09. කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම :
ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතු ය.

10. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

10.1 අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිතා කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාදවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.2 අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

10.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2026.05.25** දිනට පෙර එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය" යනුවෙන් සඳහන් කර "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ" යන ලිපිනයට එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

11. විභාග කොන්දේසි :

11.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් යොමු කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් **www.dncws.lk** වෙබ් අඩවිය හරහා වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය වෙතින් විමසිය යුතු ය. එසේ විමසීමේ දී ඔබ වෙත තබා ගත් අයදුම්පතේ පිටපතක් ද, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපතක් ද, අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමග ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර සිටීම වඩාත් ඵලදායීවනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේදී/සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

11.2 විභාගය සිංහල, දෙමළ හා අවශ්‍යතා පරිදි ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

11.3 විභාගයට පෙනී සිටින ලද මාධ්‍ය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

11.4 විභාග ගාස්තුව රු. 2000/= කි. "අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ලංකා බැංකුව, තලවතුගොඩ ශාඛාව, ගිණුම් අංක 7040440" ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම්

පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවන සේ ඇලවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කුමන කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

11.5 මෙම විභාගය **කොළඹ දී පැවැත්වේ.** විභාගය **2026 ජූලි මාසයේ දී** පවත්වනු ලැබේ.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ලැබේ :-

i. ජාතික හැඳුනුම්පත ;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙස් විභාග ප්‍රවේශ පත්‍රය මගින් ඔබට දන්වනු ලැබේ. විභාග සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළුකර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපතිවරයා සතු වේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**එම්.එම්. ආනන්ද විජිත කුමාර මාපා,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 අප්‍රේල් මස 30 දින,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
අංක 1114,
පන්නිපිටිය පාර,
තලවතුගොඩ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/තාක්ෂණික සේවා ගණයේ**

**කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026**

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
සිංහල - 1

දෙමළ - 2

ඉංග්‍රීසි - 3

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./Mrs./Miss ........................................................................

..........................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: Mr./Mrs./Miss. SILVA A.B.

1.2 සම්පූර්ණ නම : ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................

1.3 සම්පූර්ණ නම : ........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................................

02. 2.1 ලිපිනය (පෞද්ගලික) : ........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) : ........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................................

2.3 ලිපිනය (රාජකාරි) : ........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ........................................................................................................

2.4 ලිපිනය (රාජකාරි) : ........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ........................................................................................................
(ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය)

2.5 දුරකථන අංකය (පෞද්ගලික) : | | | | | | | | | | |

2.6 දුරකථන අංකය (රාජකාරි) : | | | | | | | | | | |

2.7 විද්‍යුත් ලිපිනය (email address) :- ..............................................

03. 3.1 උපන් දිනය :

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු: ............ මාස : ............ දින : ............

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. ස්ත්‍රී/පුරුෂ භාවය: පුරුෂ - 0 ස්ත්‍රී - 1 | |

06. විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2) | |

07. සුදුසුකම් :

7.1 *අදාළ අධ්‍යාපන සුදුසුකම් :*

........................................................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................

7.2 *වෘත්තීය සුදුසුකම් :*

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

7.3 *සේවා පළපුරුද්ද :*

i. දැනට දරන තනතුර : ..............................................................................
ii. එම තනතුරට පත් වූ දිනය : .....................................................................
iii. එම තනතුරේ ස්ථිර කළ දිනය : .............................................................
iv. දැනට සිටින ශ්‍රේණිය : ............................................................................
v. එම ශ්‍රේණියට පත් වූ/උසස් වූ දිනය : .......................................................
vi. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ දැනට දරන තනතුරට පත් වූ/පැමිණි දිනය : ........................ ..........................................
vii. 2026.05.25 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ දැනට දරන තනතුරේ සේවා කාලය : ........ ...................................................................

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

8.1 විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : .........................................................
8.2 ලදුපත් අංකය හා දිනය : .........................................................
8.3 ගෙවූ මුදල : ........................................................

| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

09. අයදුම්කරුගේ සහතිකය :

*ගැසට්* නිවේදනයේ 4.3 ඡේදයට අනුව .................................. දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමකට මා භාජනය වී නොමැති බව ප්‍රකාශ කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරා පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බවද පිළිගනිමි.

දිනය : ..............................................,

අයදුම්කරුගේ අත්සන.

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................................මයා/මිය/මෙනවිය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ........................................................ තනතුරේ සේවය කරන බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමකට භාජනය නොවූ බවත්, *ගැසට්* නිවේදනයේ 4.3 ඡේදයට අනුව අවුරුදු .................... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින/නොහරින බවත් මෙයින් සහතික කරමි.

....................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම : ................................................................
පදවි නාමය : ....................................................
දිනය : ............................................................
(නිල මුද්‍රාව යොදන්න)

04 - 354/2

### ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි - බණ්ඩ 1 සේවා ගණයට අයත් සමාජ විද්‍යාඥ II ශ්‍රේණියට (දෙපාර්තමේන්තුගත) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

01. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි - බණ්ඩ 1 සේවා ගණයට අයත් සමාජ විද්‍යාඥ II ශ්‍රේණියේ (දෙපාර්තමේන්තුගත) තනතුරු දෙකක් (02) සඳහා සීමිත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.05.25 දින වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු ය. උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. මාසික වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව MN 6 – 2025 වැටුප් ඛණ්ඩයට අයත් රු. 62,230 – 10x1,190 – 11x1,360 – 15x1,670 – රු. 114,140/= වැටුප් පරිමාණය අදාළ වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

4.1 අධ්‍යාපන සුදුසුකම්:

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජවිද්‍යා විෂය ධාරාව ඇතුළත් උපාධියක් ;

*සහ*

ii. පශ්චාත් උපාධියක් ලබා තිබීම.

4.2 සේවා පළපුරුද්ද :

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ද්විතීය මට්ටමේ තනතුරක අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වශයෙන් පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***සටහන.-*** සතුටුදායක සේවා කාලය යනු පූර්වාසන්න වසර 05 තුළ උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම සහ පූර්වාසන්න වසර 05 ක් තුළ කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීමයි.

4.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.4 වෙනත් සුදුසුකම් :

i. අයදුම්පත් කැඳවන දිනට පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනය දඬුවමක් ලබා නොතිබීම.

iii. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. බඳවා ගනු ලබන නිලධාරින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.
ii. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.
iii. මෙම පත්වීම එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පත්වීම් බලධාරියා තීරණය කරනු ලබන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

6.1 ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය :

විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50% |
| 2. විෂයානුබද්ධ දැනුම පරීක්ෂාව - සමාජවිද්‍යාව | පැය 02 | 100 | 50% |

6.2 විෂයය නිර්දේශය :

i. බුද්ධි පරීක්ෂණය.- අපේක්ෂයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයත්, ඔවුන්ගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

ii. විෂයානුබද්ධ දැනුම පරීක්ෂාව .- සමාජවිද්‍යාව සමාජ සජීවීකරණය, ආර්ථික හා සමාජයීය ගැටළු හඳුනා ගැනීම, විශ්ලේෂණ හා විසඳුම් සෙවීම, සිද්ධි අධ්‍යයනය, සහභාගීත්ව සංවර්ධනය, සමාජ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් සමීක්ෂණ සැලසුම් කිරීම ඇතුලු සමාජ විද්‍යාත්මක දැනුම හා එහි ප්‍රායෝගික භාවිතයන් පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් සමන්විත වේ.

07. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ද ලබා ගත යුතු ය.

08. ශ්‍රේණි උසස් කිරීම :

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 1 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

09. කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම :

II වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම ද I වන ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර 2 වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය.

10. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

10.1 අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්ත භාවිතා කර අපේක්ෂකයා විසින් තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාදවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.2 අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

10.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් **2026.05.25** දිනට පෙර එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "සමාජ විද්‍යාඥ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය" යනුවෙන් සඳහන් කර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, අංක 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ යන ලිපිනයට එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

11. විභාග කොන්දේසි :

11.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මගින් යොමු කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් www.dncws.lk වෙබ් අඩවිය හරහා වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය වෙතින් විමසිය යුතු ය. එසේ විමසීමේ දී ඔබ වෙත තබා ගත් අයදුම්පතේ පිටපතක් ද විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපතක් ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සමඟ ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර සිටීම වඩාත් ඵලදායීවනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ විභාග අංශය අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී/සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

11.2 විභාගය සිංහල, දෙමළ හා අවශ්‍යතා පරිදි ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයා අයදුම්පත ඉදිරිපත් කළ භාෂා මාධ්‍යයෙන්ම විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

11.3 විභාගයට පෙනී සිටින ලද මාධ්‍ය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

11.4 විභාග ගාස්තුව රු. 2000/= කි. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, ලංකා බැංකුව, තලවතුගොඩ ශාඛාව, ගිණුම් අංක 7040440 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවන සේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කුමන කරුණක් යටතේ වුව ද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

11.5 මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය 2026 ජූලි මාසයේ දී පවත්වනු ලැබේ.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ලැබේ :-

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාවය තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙස් විභාග ප්‍රවේශ පත්‍රය මගින් ඔබට දන්වනු ලැබේ. විභාග සම්බන්ධව වූ මෙම නියමයන්ට

පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළුකර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතුවේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**එම්.එම්. ආනන්ද විජිත කුමාර මාපා,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 අප්‍රේල් මස 30 වැනි දින,
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,
අංක 1114,
පන්නිපිටිය පාර,
තලවතුගොඩ.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍රගත/ කාර්යාලගත - බාණ්ඩ I සේවා ගණයට අයත් සමාජ විද්‍යාඥ II ශ්‍රේණියට (දෙපාර්තමේන්තුගත) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026**

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යය : ☐
සිංහල - 1

දෙමළ - 2

ඉංග්‍රීසි - 3

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම : Mr./Mrs./Miss ..........................................................................
.............................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: Mr./Mrs./Miss. SILVA A.B.

1.2 සම්පූර්ණ නම : .............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .............................................................................................................

1.3 සම්පූර්ණ නම : .............................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) .............................................................................................................

02. 2.1 ලිපිනය (පෞද්ගලික) : .............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .............................................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) : .............................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) .............................................................................................................

2.3 ලිපිනය (රාජකාරි) : .............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .............................................................................................................

2.4 ලිපිනය (රාජකාරි) :- ....................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ....................................................................................................
(ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය)

2.5 දුරකථන අංකය (පෞද්ගලික) | | | | | | | | | | |

2.6 දුරකථන අංකය (රාජකාරි) | | | | | | | | | | |

2.7 විද්‍යුත් ලිපිනය (email address) :- ..............................................

03. 3.1 උපන් දිනය :-

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවු: ............ මාස : ............ දින : ............

04. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

05. ස්ත්‍රී/පුරුෂ භාවය: පුරුෂ - 0 ස්ත්‍රී - 1 | |

06. විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2) | |

07. සුදුසුකම් :-

7.1 අදාළ අධ්‍යාපන සුදුසුකම් :

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

7.2 වෘත්තීය සුදුසුකම් :

.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................
.............................................................................................................................................

7.3 සේවා පළපුරුද්ද :-

i. දැනට දරන තනතුර : ............................................................................
ii. එම තනතුරට පත් වූ දිනය : ....................................................................
iii. එම තනතුරේ ස්ථිර කළ දිනය : ..............................................................

iv. දැනට සිටින ශ්‍රේණිය : ..........................................................................

v. එම ශ්‍රේණියට පත් වූ/උසස් වූ දිනය : ......................................................

vi. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ දැනට දරන තනතුරට
පත් වූ/පැමිණි දිනය : ..................................................................

vii. 2026.05.25 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ දැනට දරන
තනතුරේ සේවා කාලය : ..........................................................................

08. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර* :-

8.1 විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව :- ........................................................

8.2 ලදුපත් අංකය හා දිනය :- ........................................................

8.3 ගෙවූ මුදල :- .......................................................

| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

09. *අයදුම්කරුගේ සහතිකය* :-

*ගැසට්* නිවේදනයේ 4.2 ඡේදයට අනුව ................................. දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමකට මා භාජනය වී නොමැති බව ප්‍රකාශ කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරා පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බවද පිළිගනිමි.

දිනය :- .............................................,
අයදුම්කරුගේ අත්සන.

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :- (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..........................................................................මයා/මිය/මෙනවිය ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ......................................................... තනතුරේ සේවය කරන බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමකට භාජනය නොවූ බවත්, *ගැසට්* නිවේදනයේ 4.3 ඡේදයට අනුව අවුරුදු .................... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින/නොහරින බවත් මෙයින් සහතික කරමි.

.....................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :- .................................................................

පදවි නාමය :- .....................................................

දිනය :- ..............................................................

(නිල මුද්‍රාව යොදන්න)

04 - 354/3

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**
**(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත)**

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සහ ආබාධ සහිත ඉගෙනීම සඳහා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව
විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව
2026 (ප්‍රථම කණ්ඩායම - ප්‍රධාන බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සහ ආබාධ සහිත ඉගෙනීම සඳහා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සහ ආබාධ සහිත ඉගෙනීම සඳහා උපදේශනය පිළිබඳ පුළුල් දැනුමක් ලබාගැනීමට හෝ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය හරහා උසස් ජාතික ඩිප්ලෝමා අදියරය දක්වා සිය වෘත්තීය දැනුම වර්ධනය කරගැනීම සඳහා උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකියි.

**සුදුසුකම් :**

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ප්‍රාථමික, ද්විතීයික සහ පශ්චාත් ද්විතීයික විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පාසල් සඳහා ගුරු පත්වීම් ලබා සේවයේ නියුතු ගුරුවරුන්/ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ගුරුවරුන්/වෛද්‍ය සහ හෙද වෘත්තිකයින් සඳහා පමණක් විවෘත ව පවතියි.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට මෙම පාඨමාලාව සඳහා කිසිඳු වයස් සීමාවකින් තොරව ඉල්ලුම් කළ හැකියි.

**පාඨමාලාවේ ස්වභාවය :** මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

**මාධ්‍ය :** සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය :**

එක් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවකි. සජීවී දේශන, පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

**පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :** මුළු පාඨමාලා ගාස්තුව රු. 30,000.00 කි.
පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ දී රු. 1000.00ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.
රු. 30,000.00 ක මුදල එකවර හෝ රු. 2500.00 බැගින් දොළොස් මාසිකව ගෙවිය හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :**

අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය,
2. ගුරු පත්වීම් ලිපියේ/සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නියුතු පිරිස් තම පත්වීම් ලිපියේ ඡායාරූපය

070 - 419 1660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

**වැඩි විස්තර සඳහා :** කාර්යාලීය වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 032 - 3137500 දුරකතන අංකය ඔස්සේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව අමතා විමසිය හැකිය.

ප්‍රධානී - විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

04 - 357

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්වරයාගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2026

බලයලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්වරයාගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය අයදුම්කරුවන්ගේ ප්‍රමාණය සහ පදිංචිය අනුව දිවයිනේ ස්ථාන කිහිපයක දී හෝ කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - ඛණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II කොටස - පිඹුරු ඇඳීම

2. විභාගයේ I කොටස 2026 ජූලි මස 25 දින දී ද, II කොටස 2026 ඔක්තෝබර් මස 24 දින දී පැවැත්වෙනු ඇත. I කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට II කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන්ම එකවර සමත්වන අපේක්ෂකයින්, බලයලත් සැලසුම් ශිල්පීන් සඳහාවන සර්වේයර් ජනරාල්වරයාගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතු ය.

(අ) ක්ෂේත්‍ර සටහනක් මගින් ඛණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් ඛණ්ඩාංක කිරීමට ;

(ආ) CAD මෘදුකාංගය භාවිතයෙන් හා ඛණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට, ක්ෂේත්‍රඵලය ගණනය කිරීමට හා Microsoft Excel සහ Microsoft Word ආධාරයෙන් දෙන ලද ආකෘතියට අනුව ඉ.වි. ලැ. ලිවීමට සහ දෙන ලද පිඹුරක් අංකිතකරණය කිරීම හා මුල් පරිමාණයට පිළියෙල කර මුද්‍රණය කිරීමට සහ බ්‍රිතාන්‍ය ඒකක ක්‍රමය යටතේ ඇති පිඹුරක් ඉල්ලනු ලබන මෙට්‍රික් පරිමාණයකට අනුව විශාලනය කර හෝ කුඩා කර අනුරේඛනය කරගැනීමට ;

4. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් :

(අ) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම,

*සහ*

(ආ) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩු කාල සීමාවක් සහිත, සැලසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

5. විභාග ගාස්තු :

5.1 විභාගයේ I වැනි කොටස සඳහා ගාස්තුව රු. 1,200.00 කි. මෙම මුදල සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් කවුන්ටරය වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් හෝ දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත හෝ https://govpay.lk මගින් මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) විභාග ගාස්තුව මුදල් ඇණවුම් හෝ මුද්දර මගින් හෝ චෙක්පත් මගින් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.2 විභාගයේ II වැනි කොටස සඳහා විභාග ගාස්තුව රු. 6,800.00 කි. විභාගයේ I වැනි කොටස සමත් (විෂයයන් දෙක සඳහා ලබාගත් මුළු ලකුණු එකතුවේ සාමාන්‍යය 60% ක් විය යුතු ය.) අයදුම්කරුවන් වෙත ඒ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ. විභාගයේ I වැනි කොටස සමත් අය පමණක් II වැනි කොටස සඳහා විභාග ගාස්තු ගෙවා නැවත ඉල්ලුම් කළ යුතු ය.

6. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම* :

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ.මී. 21x සෙ. මී. 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක්, පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ තැපෑලෙන් යැවිය යුතු ය. ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ "බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2026" යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (විභාග),
විභාග අංශය,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.

දෙනලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද, නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද, *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් **2026 මැයි මස 29** දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය. එදිනට පසුව එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

9. (I) විභාගයේ පළමුවන කොටස සඳහා අවශ්‍ය ඛණ්ඩාංක පත්‍ර හා කඩදාසි විභාග ශාලාවේ දී සපයනු ලැබේ. ඛණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු හා අවශ්‍ය අනෙකුත් උපකරණ රැගෙන ආ යුතු ය. විභාග ශාලාධිපතිගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.

(II) විභාගයේ දෙවන කොටස සඳහා අවශ්‍ය මුද්‍රණ කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍ර විභාග ශාලාවේ දී සපයනු ලැබේ. CAD මෘදුකාංගය, Microsoft Excel, Microsoft Word සහිත ලැප්ටොප් පරිගණකයක්, මෘදුකාංග රහිත ගණක යන්ත්‍රයක් සහ අවශ්‍ය අනෙකුත් උපකරණ රැගෙන ආයුතු ය.

10. (i) සෑම විභාග අපේක්ෂකයෙකු ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකි ය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්

(ii) ඉහත 10(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

4. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

**පී. කේ. එල්. එස්. පඩුවාවල,**
සර්වේයර් ජනරාල්.

2026 අප්‍රේල් මස 23 දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්වරයාගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2026**

විභාග අංකය [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම (මයා/මිය/මෙය ) :- ..........................................

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :-..........................................

(iii) මුලකුරු සමග නම පැහැදිලිව ඉංග්‍රීසියෙන් :- ..........................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................

(ඇ) ස්ත්‍රී /පුරුෂ භාවය :- ..........................................

(ඈ) තනතුර :- ..........................................

(ඉ) රැකියා ස්ථානයේ ලිපිනය : ..........................................

(ඊ) ස්ථිර ලිපිනය : ..........................................

(උ) ජංගම දුරකථන අංකය : ..........................................................................................................

(ඌ) උපන් දිනය : ........................................................................................

(එ) අධ්‍යාපන සුදුසුකම් : .............................................................................................................................................

(ඒ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි විභාගයට පෙනී සිටිනු ලබන්නේ I වන කොටස සඳහා ද II වැනි කොටස සඳහා ද යන වග (II වැනි කොටසට පෙනී සිටීම සඳහා අනිවාර්යයෙන්ම I වන කොටස සමත් විය යුතු ය.)
..............................................................................................................................................................

(ඔ) ගෙවන ලද ගාස්තු : .......................................................

(ඕ) රිසිට්පත් අංකය : .......................................................

(ඖ) නිකුත් කළ කාර්යාලය : .......................................................

(අං) දිනය : ..........................

ඔබ විසින් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය හෝ https://govpay.lk මගින් මාර්ගගත ක්‍රමයට මුදල් ගෙවා ලබාගත් රිසිට්පත මෙහි අලවන්න.

ම විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි හා සත්‍ය තොරතුරු බව සහතික කරමි.

දිනය :

......................................................,
අයදුම්කරුගේ අත්සන.

04 - 372

---

**සංශෝධනයයි**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහාවන සීමිත තරග විභාගය - 2025

අංක 2,463 දරන හා 2025 නොවැම්බර් මස 14 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහාවන සීමිත තරග විභාගය - 2025" යන නිවේදනයේ 2.1 ඡේදයේ විධිවිධාන පරිදි නියමිත කාලසීමාව තුළ මාර්ගගත ක්‍රමය අනුව අයදුම්පත් සම්පූර්ණ කරන ලද නමුත් බාගත කරගත් එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියාගේ සහතිකය සහිතව අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විටත් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු නොකිරීම හේතුවෙන් විභාග ප්‍රවේශපත නොලද අයදුම්කරුවන් **2026.05.15** දින හෝ එදිනට පෙර නිවැරදිව සහතික කරන ලද අයදුම්පතෙහි මුද්‍රිත පිටපත විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙහිදී නව අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති අතර, **2026.01.02** දින හෝ එදිනට පෙර මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් සම්පූර්ණකර අදාළ විභාග ගාස්තු ගෙවීමෙන් අනතුරුව එම අයදුම්පතේ මුද්‍රිත පිටපත් ළඟ තබාගෙන ඇති නිලධාරින්ට පමණක් සිය අයදුම්පතෙහි මුද්‍රිත පිටපත විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට මෙම අවස්ථාව හිමි වේ. විභාගය පැවැත්වෙන දිනය හා විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරියේ දී දැනුම් දෙනු ඇත.

අංක 2,463 දරන හා 2025 නොවැම්බර් මස 14 දිනැති හා අංක 2, 467 දරන හා 2025 දෙසැම්බර් 12 ගැසට් නිවේදනයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය හා අනෙකුත් සියලුම කරුණු එලෙසම නොවෙනස්ව පවතී.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළ කරනු ලබන මෙම *ගැසට්* නිවේදනයේ භාෂා පාඨ අතර යම්කිසි අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 අප්‍රේල් මස 28 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

04 - 411

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.